# යෝජනාව
## DFCC Salary Plus

DFCC BANK
Keep Growing

| | |
|---|---|
| **සුදුසුකම් ලැබීම** | (1) ශ්‍රී ලංකාවේ සිටින සේවා නියුක්තිකයින් විය යුතු ය.<br><br>(1.1) මාසිකව රුපියල් 25,000.00 (රුපියල් විසි පන් දහස) ක සිට රුපියල් 49,999.00 (රුපියල් හතළිස් නව දහස් නවසිය අනූ නවය) ක් දක්වා වූ අවම ශුද්ධ වැටුපක් (මූලික වැටුප + ස්ථාවර දීමනා - සියලුම අඩු කිරීම්) ලබන පාරිභෝගිකයින් විසින් සෑම මසක ම තම වැටුප ජංගම හෝ ඉතිරි කිරීමේ ගිණුමකට බැර කළ යුතු ය.<br><br>(1.2) Salary Plus යෝජනාවට සුදුසුකම් ලැබීම සඳහා පාරිභෝගිකයාට තම වැටුප, ඔහුගේ හෝ ඇයගේ දැනට පවතින DFCC ජංගම හෝ ඉතිරි කිරීමේ ගිණුමක් වෙත බැර කිරීම ද සිදු කළ හැකි ය. |
| **මූලික විශේෂාංග** | (1) පහත සඳහන් සේවාවන්, ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ:<br><br>(1.1) ජංගම ගිණුම පවත්වා ගෙන යෑම සඳහා තිබිය යුතු අවම ශේෂය<br>(1.2) ඩෙබිට් කාඩ්පත් නිකුත් කිරීමේ දී අය කෙරෙන ගාස්තුව (සම්බන්ධ වීමේ ගාස්තුව)<br>(1.3) ඩිජිටල් බැංකු පහසුකම්<br>(1.3.1) සියලුම පාරිභෝගික ගනුදෙනු පිළිබඳව SMS මාර්ගයෙන් දැනුම් දීම<br>(1.3.2) විද්‍යුත් ගිණුම් ප්‍රකාශ (e-Statements)<br>(1.3.3) මාර්ගගත බැංකු සේවා<br>(1.3.4) DFCC ONE |
| **ප්‍රතිලාභ සහ අගය එකතු කළ සේවාවන්** | (1) ජංගම හා ඉතිරි කිරීමේ ගිණුම්වලට සේවය ලබා දීමේ දී පැන නගින බොහෝ ගාස්තුවලින් නිදහස් වීම.<br><br>(2) අවම ශේෂයක අවශ්‍යතාවක් නොමැති ව හෝ ශුන්‍ය ශේෂයකින් (0) වුවත්, නව ජංගම හෝ ඉතිරි කිරීමේ ගිණුමක් ආරම්භ කිරීමට හැකි වීම.<br><br>(3) පුද්ගලික ණය පහසුකම් අයැදුම් කිරීම සඳහා සුදුසුකම් ලැබීම. |

DFCC BANK
Keep Growing

| | |
|---|---|
| **ගිණුමක් විවෘත කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය** | (1) නිසි ලෙස අත්සන් කරන ලද, පුද්ගලික ගිණුමක් විවෘත කිරීමේ පෝරමය<br>(2) නිසි ලෙස අත්සන් කරන ලද, DFCC Salary Plus යෝජනාවේ නියමයන් සහ කොන්දේසි සඳහන් පත්‍රිකාව<br>(3) සම්මත KYC ලියකියවිලි |
| **ගාස්තු සහ අය කිරීම්** | https://www.dfcc.lk/interest-rates/ |
| **නියමයන් සහ කොන්දේසි** | (1) DFCC Salary Plus යටතේ පිරිනමනු ලබන පහසුකම්/අගය එකතු කළ සේවාවන් සියල්ල ම, DFCC Salary Plus යෝජනාව යටතේ විශේෂයෙන් නිදහස් කර ඇති අවස්ථාවක දී හැර, අන් සෑම විටම එම පහසුකම්/අගය එකතු කළ සේවාවන් සඳහා සාමාන්‍යයෙන් අදාළ වෙන නියමයන් සහ කොන්දේසිවලට යටත් වේ.<br><br>(2) වැටුප් බැර කිරීම් හැරුණු කොට වෙනත් ඕනෑම තැන්පත් කිරීමක්, අවශ්‍ය පරිදි ගිණුමෙහි තැන්පත් කළ හැකිය. කෙසේ වෙතත්, ඉතිරි කිරීමේ ගිණුම්වල බැර කිරීම් සඳහා වන චෙක් පත් භාර ගැනීම, බැංකුවේ තනි අභිමතය පරිදි සිදු වනු ඇත.<br><br>(3) මූලික තැන්පතුවක් නොමැතිව ශුන්‍ය ශේෂයකින් (0) ගිණුමක් විවෘත කර ඇත්නම්, ගිණුම විවෘත කළ දින සිට දින 30 ක් ඇතුළත එම ගිණුම වෙත වැටුප බැර කිරීම මගින් එහි ශේෂය පවත්වා ගත යුතු ය.<br><br>(4) පාරිභෝගිකයා විසින් ඉහත සඳහන් කළ අවම මාසික වැටුප අඛණ්ඩව මාස 3 (තුන) ක් දක්වා බැර කිරීමට අපොහොසත් වුවහොත්, DFCC Salary Plus යෝජනාව හා සම්බන්ධ සියලුම සේවා, වරප්‍රසාද සහ ප්‍රතිලාභ අහිමි කිරීම සඳහා බැංකුවට අයිතිය ඇත.<br><br>(5) බැංකුව වෙත කරන ලිඛිත දැනුම් දීමක් හරහා DFCC Salary Plus සේවාවන් අත්හිටුවීමට පාරිභෝගිකයාට අයිතිය තිබේ.<br><br>(6) DFCC Salary Plus යෝජනාව යටතේ ඕනෑම පාරිභෝගිකයෙකු වෙත ලබා දෙන බැංකු අයිරා, පුද්ගලික ණය සහ ක්‍රෙඩිට් කාඩ්පත් ආදී සියලුම පහසුකම්, එම පහසුකම්වලට අදාළ වන සම්මත ණය ඇගයීමේ සහ ලේඛන ක්‍රියාවලියට යටත් විය යුතු ය.<br><br>(7) මෙහි අඩංගු නියමයන් සහ කොන්දේසිවලට අමතරව, ගිණුමක් විවෘත කරන අවස්ථාවේ දී බැංකුව විසින් සියලුම ගිණුම් හිමියන් වෙත සාමාන්‍යයෙන් නිකුත් කරන නියමයන් සහ කොන්දේසිවලට ද, පාරිභෝගිකයා බැඳී සිටිනු ඇත. |

| | |
|---|---|
| **ගිණුමෙහි ගනුදෙනු පිළිබඳ විස්තර සහ විමසීම් සඳහා** | **අමතන්න:** 0112 350 000 (පැය 24 පුරාම සක්‍රීය ක්ෂණික ඇමතුම් අංකය)<br>**විද්‍යුත් ලිපිනය:** care@dfccbank.com<br>ඕනෑම DFCC බැංකු ශාඛාවකින් සහයෝගය ලබා ගත හැකි ය.<br>**ප්‍රතිචාර දැක්වීමේ කාලය:** පැය 24 යි |
| **පැමිණිල්ල විභාග කිරීමේ ක්‍රියා පටිපාටිය** | ඔබේ පැමිණිල්ල වැඩ කරන දින 01 ක් ඇතුළත භාර ගෙන, වැඩ කරන දින 02 ක් ඇතුළත විසඳුම් සෙවීමේ ක්‍රියාවලිය ආරම්භ කෙරෙනු ඇති නමුත්, සමහර ගැටලු සඳහා වැඩි කාලයක් ගත වීමට ද ඉඩ ඇත. සාධාරණ කාලයක් ඇතුළත ඔබේ ගැටළු සඳහා සතුටුදායක ප්‍රතිචාරයක් නොලැබුණේ නම්, කරුණාකර අප ව සම්බන්ධ කර ගන්න.<br><br>විද්‍යුත් තැපෑල: care@dfccbank.com<br>අපගේ ඇමතුම් මධ්‍යස්ථානය: 0112 350 000<br><br>**මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා**<br>The Financial Ombudsman,<br>නො. 01, බෙතෙස්දා පෙදෙස, මිලාගිරිය, කොළඹ 05<br>**දුරකථන අංකය:** (011) 2 595624<br>**විද්‍යුත් ලිපිනය:** fosril@slnet.k<br>**වෙබ් අඩවිය:** www.financialombudsman.lk<br><br>**ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව** (FCRD)<br>https://www.cbsl.gov.lk/en/fcrd |